*සැ.යු.-* මෙවර *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2015.12.31 දින දක්වා වූ හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන්ගේ නාමාවලියක් භාෂාත්‍රයෙන්ම පළවේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,973 - 2016 ජුනි මස 24 වැනි සිකුරාදා - 2016.06.24**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )

| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 1042 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1044 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |

*සැ. යු.* - සමථ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත 2016 මැයි මස 06 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ***ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 ජූලි මස 15 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2016 ජූලි මස 01 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**බී. කේ. එස්. රවීන්ද්‍ර,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2016 ජුනි මස 21 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු - ඇබෑර්තු

## පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව

පොල්ගහවෙල ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී පවතින පහත උපලේඛනයේ සඳහන් තනතුරට බඳවා ගැනීම සඳහා ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු අංකය | තනතුර | බඳවා ගැනීමේ ශ්‍රේණිය | තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය මාසික (රා.ප.ච.6/2006 IV අනුව) | අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සුදුසුකම් |
|---|---|---|---|---|---|
| 03 | වැඩ/ ක්ෂේත්‍ර කම්කරු | ශිල්පීය නොවන III | 01 | රු. 24250/- 10x250/ - 10x270/ 10x300/ - 12x330/ 36410/= (PL 1-2016 A) තුන්වන වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය. | අධ්‍යාපන සුදුසුකම්<br>(I) අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී යටත් පිරිසෙයින් විෂයන් 02 ක් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයන් හැර)<br>(II) 2008/11/19 වැනි දින වන විට ප්‍රාථමික ශිල්පීය නොවන තනතුරක අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන ඇති සේවකයින්ට පමණක් පෞද්ගලික වන සේ එවකට පැවති බඳවා ගැනීමේ පටිපාටියේ අධ්‍යාපන සුදුසුකම් අදල වේ. |

*02. අවශ්‍ය වෙනත් සුදුසුකම් :-*

(I) අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
(II) යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.
(III) අයදුම්කරු අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03 කට නොඅඩු කාලයක් පොල්ගහවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය. (පදිංචිය වසමේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරනු ලබන සහතිකයක් මත අදල ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කර සහතික කර තිබිය යුතුය.)
(IV) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය. (එහෙත් දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් සභා රාජ්‍ය සේවයේ නියුතු ස්ථිර සේවකයින් සඳහා මෙම උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.)
(V) දැනටමත් ප්‍රාථමික ශිල්පීය, අර්ධ ශිල්පීය හා ශිල්පීය නොවන තනතුරක අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන ඇති සේවකයින්ට, ඔවුන්ට පමණක් පෞද්ගලික වනසේ උපරිම වයස් සීමාවක් බල නොපැවැත්වේ. (අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනමට පත්වීම අවු. 18ත් 45 අතර සිදු විය යුතුය.)
(VI) අයදුම්කරුවන් දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඩුවම් ලැබුවෙකු නොවිය යුතුය.
(VII) දැනටමත් පළාත් සභා රාජ්‍ය සේවයේ නියුතු අයකු නම් ඔහු අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 5 ක් තුළ අවවාද කිරීමක් හැර දඬුවම් ලබා නොතිබිය යුතු අතර එකී පූර්වාසන්න වසර 5 ක් තුළ සියලු වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතුය.

*03. බඳවා ගැනීමේ ක්‍රමය :-*

මෙම තනතුර සඳහා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් හා ප්‍රායෝගික පරීක්ෂණයකින් පසු සුදුසුකම් ලත් අයදුම්කරුවන් අදල තනතුර සඳහා බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

*04. සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :-*

(I) මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය, වැන්දඹු අනත්දරු අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.
(II) පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වේ.

(III) මෙම බඳවා ගැනීමේ කොන්දේසි වලට අමතරව ආයතන සංග්‍රහයේ කොන්දේසි වලටද, මුදල් රෙගුලාසි වලටද, වයඹ පළාත් රාජ්‍ය සේවා කොන්දේසි හා රෙගුලාසි වලටද, පළාත් පාලන ආයතනයට අදාල ආඥා පනත්/පනත් වල විධිවිධාන වලටද, පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද නියෝග වලටද අනුකූලව කටයුතු කිරීමට එකඟ විය යුතුය.

05. මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.

*ඉල්ලුම් කල යුතු ආකාරය :-*

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පතක් 2016.07.17 දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ "ලේකම්, ප්‍රාදේශීය සභාව, පොල්ගහවෙල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම් පස ඉහළ කෙලවරේ "............................. තනතුර සඳහා අයදුම්පත" (තනතුරේ නම) යනුවෙන් සඳහන් කල යුතුය. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා තම ඉල්ලුම්පත සේවා ප්‍රධානියා මඟින් එවිය යුතු අතර නියමිත දිනයට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුරේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල පොල්ගහවෙල ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු වේ.

අයදුම්පත සමග පහත සඳහන් සහතික වල පිටපත් ඉදිරිපත් කල යුතු අතර සම්මුඛ පරීක්ෂණයේ දී මුල් පිටපත් ඉදිරිපත් කල යුතුය.

1. උප්පැන්න සහතිකය,
2. අධ්‍යාපන සහතිකය,
3. පදිංචිය පිළිබඳ ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය,
4. මෑතකදී ලබා ගත් චරිත සහතික 2 ක් (එකක් ග්‍රාම නිලධාරිගෙන් විය යුතුය).

ජේ. එම්. නිමල් ජයසිංහ.
ලේකම්,
ප්‍රාදේශීය සභාව - පොල්ගහවෙල.

2016 ක් වූ ජුනි මස 01 වැනි දින,
පොල්ගහවෙල ප්‍රාදේශීය සභා කාර්යාලය,
පොල්ගහවෙල.

ආදර්ශ අයදුම්පත

**පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව**

***වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ පොල්ගහවෙල ප්‍රාදේශීය සභාවේ තනතුර සඳහා බඳවා ගැනීම - 2016***
***........................................................................................................ තනතුර සඳහා අයදුම්පත***

1. අයදුම්කරුගේ නම මුලකුරු සමග :——————————.
   මුලකුරු වලින් හැඳින්වෙන නම් :——————————.
2. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————————.
3. ස්ථිර ලිපිනය :——————————.
4. පොල්ගහවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි කාලය :——————————.
5. උපන් දිනයඃ- වර්ෂයඃ:——————————. මාසයඃ:——————————. දිනයඃ:——————————.
6. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයසඃ- අවුරුදු:——————. මාස:——————. දින:——————.
7. ජාතික හැඳුනුම්පත් අංකය:——————————.
8. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————.

9. විවාහක/අවිවාහක බව:——————————.

10. ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින්ද? ලියාපදිංචි වීමෙන්ද? :——————————.

11. අධ්‍යාපන සුදුසුකම් :- සමත් වූ විභාග පිළිබඳ විස්තර :——————————.
(සහතික වල ඡායා පිටපත් අමුණන්න.)

12. වෘත්තීය සුදුසුකම් :-(සහතික මගින් සනාථ කල යුතු ය) :——————————.

13. සේවා පළපුරුද්ද :——————————.

14. ඔබ කවරදක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද? :——————————.

15. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම් එම සේවා කාලය පිළිබඳ විස්තර :——————————.
එම පත්වීමේ ස්වභාවය ( ස්ථිර/අනියම්/ආදේශක/කොන්ත්‍රාත් /තාවකාලික) :——————————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳව කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇති බවට ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත්වන බව ද මම දනිමි.

——————————.
අයදුම්කරුගේ අත්සන.

දිනය:——————————.

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම අයදුම්කරු වන .......................මහතා/මහත්මිය/මෙනවිය දැනට මෙම ආයතනයේ .................................වශයෙන් සේවය කරයි. ඔහු/ඇය සේවයෙන් නිදහස් කල හැක/නොහැක. ඔහු/ඇය මොනම ආකාරයෙන් හෝ අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 5 තුළදී විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම හැර) භාජනය වී නොමැති බවද, එකී පූර්වාසන්න වසර 5 තුල සියලු වැටුප් වර්ධක උපයාගෙන ඇති බව ද මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි/නොකරමි.

——————————.
දෙපාර්තමේන්තුව/ආයතනයේ හෝ ලෙස
පවරනු ලැබූ නිළධාරියාගේ අත්සන.

නම :——————————.
පදවි නාමය :——————————.
දෙපාර්තමේන්තුව :——————————.
දිනය :——————————.

06-723

# පළාත් පාලන නිවේදන

## නෙළුව ප්‍රාදේශීය සභාව

සම්මත අතුරු ව්‍යවස්ථා වැළඳ ගැනීම

1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වන අධිකාරය මත 1982 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ දෙවන වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ දකුණු පළාතේ , පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඔහු විසින් සාදනු ලැබූ හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ අංක 1834 හා 2013.10.25 දිනැති ගැසට් පත්‍රයේ IV (අ) කොටසේ නිවේදනය කරනු ලැබූ දකුණු පළාතේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ තුළ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ කෙටුම්පත් අතුරු ව්‍යවස්ථාව සහ මදුරුවන් හා රෝගකාරක කෘමීන් විනාශ කිරීම පිළිබඳ කෙටුම්පත් අතුරු ව්‍යවස්ථාව දකුණු පළාත් සභාව විසින්

2014.08.12 දින මහ සභාවේ දී ස්ථිර කර 2014-10-17 දින අංක 1884/61 iv (අ) පළාත් සභා *ගැසට් පත්‍රයෙන්* ප්‍රකාශයට පත් කර ඇති අතර එකී අතුරු ව්‍යවස්ථාව පිළිගැනීමටත් 2016.06.01 දින සිට අදාළ විධිවිධාන නෙළුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කිරීමටත්, තීරණ අංක 130 යටතේ තීරණය කරන ලද බව මහජනයා වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එන්.එල්. ප්‍රේමසිරි,
ලේකම්,
නෙළුව ප්‍රාදේශීය සභාව.

06-681/2

---

## පිටබැද්දර ප්‍රාදේශීය සභාව

### සම්මත අතුරු ව්‍යවස්ථාව වැළඳ ගැනීම

1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 02 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වන අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ දෙවන වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ දකුණු පළාතේ , පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඔහු විසින් සාදනු ලැබූ හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ අංක 1834 හා 2013.10.25 දිනැති *ගැසට් පත්‍රයේ* iv (අ) කොටසේ නිවේදනය කරනු ලැබූ දකුණු පළාතේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබද කෙටුම්පත් අතුරු ව්‍යවස්ථාව හා මදුරුවන් හා රෝගකාරක කෘමීන් විනාශ කිරීම පිළිබද කෙටුම්පත් අතුරු ව්‍යවස්ථාව දකුණු පළාත් සභාව විසින් 2014-08-12 දින මහ සභාවේ දී ස්ථිර කර 2014-10-17 දින අංක 1884/61 iv (අ) පළාත් සභා *ගැසට් පත්‍රයෙන්* ප්‍රකාශයට පත් කර ඇති අතුරු ව්‍යවස්ථාව, පිටබැද්දර ප්‍රාදේශීය සභාව 2016.04.22 දිනයෙන් තීරණ අංක 89 යටතේ වැළඳ ගැනීමටත්, *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* පළකරනු ලබන දින සිට ක්‍රියාත්මක කිරීමට මහජනයා වෙත මෙයින් නිවේදනය කිරීම සුදුසු යැයි තීරණය කරමි.

මුදලිගේ ජිනදාස,
ලේකම්,
පිටබැද්දර ප්‍රාදේශීය සභාව.

2016 අප්‍රේල් මස 22 වැනි දින,
පිටබැද්දර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී.

06-682

---

## බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව

### සම්මත අතුරු ව්‍යවස්ථා

1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වන අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථාව) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ දකුණු පළාතේ , පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඔහු විසින් සාදනු ලැබූ හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1834 හා 2013.10.25 දිනැති *ගැසට් පත්‍රයේ* iv (අ) කොටසේ නිවේදනය කරනු ලැබූවා වූ ද, දකුණු පළාතේ පළාත් සභාව විසින් අනුමත කර ඒ බව අංක 1884/61 හා 2014 ඔක්තෝබර් මස 17 දිනැති *ගැසට් පත්‍රයේ* iv (අ) කොටසේ නිවේදනය කරනු ලැබූවා වූ ද, දකුණු පළාතේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ තුළ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබද කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා සහ මදුරුවන් සහ රෝගකාරක කෘමීන් විනාශ කිරීම පිළිබද කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තියේ (3) වැනි උප වගන්තියේ විධිවිධාන වලට යටත්ව පිළිගැනීමටත් , මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පලවන දින සිට අදළ විධිවිධාන බෙලිඅත්ත ප්‍රාදේශීය සභා

බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කිරීමටත් , මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ 2016.04.26 වැනි දින තීරණ අංක 06 යටතේ තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

කේ.එච්.අබේනායක,
ලේකම්,
බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව.

2016 ජුනි මස 01 වැනි දින,
බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව,
බෙලිඅත්ත.

06-683

---

## අතුරු ව්‍යවස්ථා

### පස්ගොඩ ප්‍රාදේශීය සභාව

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථාව) පනත

***ඝන අපද්‍රව්‍ය කළමණාකරණය පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථාව***

1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ දකුණු පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබූ වර්ෂ 2013 ඔක්තෝබර් මස 25 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ අංක 1834 යටතේ පළ කරනු ලැබූ සම්මත අතුරු ව්‍යවස්ථාව හා සම්බන්ධයෙනි.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 93 වගන්තිය සහ 126 වැනි වගන්තියේ 9 වැනි උප වගන්තියේ (ආ) සහ (ඇ) ඡේදවලින් ඝන අපද්‍රව්‍ය කළමණාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථා පැනවීමට ප්‍රාදේශීය සභා වලට බලය පැවරී ඇති අතර, 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තියේ ප්‍රකාර, මෙම සම්මත අතුරු ව්‍යවස්ථාව පිළිගෙන වැළඳගෙන ගැසට් පත්‍රයේ පළ වන දින සිට ක්‍රියාත්මක කිරීම සඳහා වර්ෂ 2016.03.28 දින තීරණ අංක 312 යටතේ තීරණය කළ බව මෙයින් දන්වමි.

එල්. ඉන්ද්‍රා ප්‍රේමලතා,
ලේකම්,
පස්ගොඩ ප්‍රාදේශීය සභාව.

2016 මාර්තු මස 30 වැනි දින,
පස්ගොඩ ප්‍රාදේශීය සභාවේ දී ය.

06-825/1

---

## පස්ගොඩ ප්‍රාදේශීය සභාව

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථාව) පනත යටතේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මදුරුවන් සහ රෝග කාරක කෘමීන් විනාශ කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ දකුණු පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබූ වර්ෂ 2013 ඔක්තෝබර් මස 25 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ අංක 1834 යටතේ පළ කරනු ලැබූ සම්මත අතුරු ව්‍යවස්ථාව හා සම්බන්ධයෙනි.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 126 වැනි වගන්තියේ (IX) වැනි උප වගන්තියේ (එ) ඡේදයෙන් මදුරුවන් සහ රෝග කාරක කෘමීන් විනාශ කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා පැනවීමට ප්‍රාදේශීය සභා වලට බලය පැවරී ඇති අතර, 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තියේ ප්‍රකාර, මෙම සම්මත අතුරු ව්‍යවස්ථාව පිළිගෙන වැළඳගෙන *ගැසට් පත්‍රයේ* පළ වන දින සිට ක්‍රියාත්මක කිරීම සඳහා වර්ෂ 2016.03.28 දින තීරණ අංක 312 යටතේ තීරණය කළ බව මෙයින් දන්වමි.

එල්. ඉන්ද්‍රා ප්‍රේමලතා,
ලේකම්,
පස්ගොඩ ප්‍රාදේශීය සභාව.

වර්ෂ 2016 මාර්තු මස 30 වැනි දින,
පස්ගොඩ ප්‍රාදේශීය සභාවේ දී ය.

06-825/2

---

## මොරටුව මහ නගර සභාව

මෙහි පහත උපලේඛනයෙහි සඳහන් අය විසින් එම උපලේඛනයෙහි සඳහන් ස්ථානයේ මස් වෙළඳාම පවත්වාගෙන යාම පිණිස 2016 වර්ෂයට විශේෂ බලපත්‍ර ඉල්ලුම් කර ඇත. ඒ අනුව විශේෂ බලපත්‍ර නිකුත් කිරීම සඳහා මොරටුව මහ නගර සභා සීමාව තුළ පදිංචි යම් අයෙක් විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම *ගැසට් පත්‍රයේ* පලවූ දින සිට දින 14ක් ඇතුලත මා වෙත ලියා එවීමට බල ඇති බවත් (272 වැනි අධිකාරිය) ගෝඝාතක ආඥා පනතේ 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

නාගරික කොමසාරිස්,
මොරටුව මහ නගර සභාව.

2016 ජුනි මස 07 වැනි දින,
මොරටුව මහ නගර සභාවේ දී ය.

උපලේඛනය

| *ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය* | *ව්‍යාපාරය පවත්වාගෙන යන ස්ථානය* | *වෙළඳ ව්‍යාපාරයේ ස්වභාවය* | *වෙළඳ ව්‍යාපාරයේ නම* |
|---|---|---|---|
| ලාෆ් සුපිරි වෙළඳ සැල, සොයිසාපුර, මොරටුව. | අංක 164/3A-B, සොයිසාපුර පාර, මොරටුව. | ශීත කල කුකුල් මස් විකිණීම | ලාෆ් සුපිරි වෙළඳ සැල, |
| මුදුගමුව හේවගේ ප්‍රියන්ත අංක 148/9,4 වන පටුමග, ලුනාව, මොරටුව. | අංක 106,චාල්ස් පෙදෙස,ලුනාව, මොරටුව. | ශීත කල කුකුල් මස් විකිණීම | ප්‍රියන්ත ස්ටෝර්ස් |
| ලාෆ් සුපර් මාර්කට් පුද්ගලික සමාගම අංක 06,පරණ ගාලුපාර, මොරටුව. | පරණ ගාලුපාර,මොරටුව. | ශීත කල කුකුල් මස් විකිණීම | ලාෆ් සුපර් මාර්කට් |
| හැන්නැදගේ කුමුදු සුරේෂ්නි පීරිස් අංක 75D, සම්මා සමාධි මාවත, දන්දෙණියවත්ත, දේවාල පාර, කටුබැද්ද. | අංක 222, කල්දෙමුල්ල හංදිය, අඟුලාන දුම්රියපොල පාර. | ශීත කල කුකුල් මස් විකිණීම | කුමුදු ෆාම් ෂොප් |

| *ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය* | *ව්‍යාපාරය පවත්වාගෙන යන ස්ථානය* | *වෙළඳ ව්‍යාපාරයේ ස්වභාවය* | *වෙළඳ ව්‍යාපාරයේ නම* |
|---|---|---|---|
| මොහමඩ් හුසේන් මොහමඩ් අහ්සන් අංක 354,එගොඩඋයන පාර, එගොඩඋයන. | අංක 354/A, එගොඩඋයන පාර, එගොඩඋයන. | ශීත කළ එළු මස්, කුකුල් මස් සහ හරක් මස් විකිණීම | මෝදර ෆාම් ෂොප් |
| ඩබ්.ඒ.කේ.මාර්ක් ඇන්ටන් අංක 41/2,1 වන පටුමග, ෆොන්සේකා පාර,ලක්ෂපතිය, මොරටුව. | අංක 279,ද සොයිසා පාර,මෝල්පේ, මොරටුව. | ශීත කළ කුකුල් මස් විකිණීම | මාර්ක් ෆාම් ෂොප් |
| එස්.එස්.අයිනුල් මර්ලියා බී/5, ජී.-7 සොයිසා පුර මහල් නිවාස, මොරටුව. | අංක 03, සොයිසා පුර මහල් නිවාස, මොරටුව. | ශීත කළ කුකුල් මස් විකිණීම | ෆාම් ෂොප් |
| යූ.ඩී.ප්‍රදීප් කුමාර අංක 8/2, දුම්රියපල පාර, මොරටුව. | අංක 5/2, දුම්රිය පල පාර, මොරටුව. | ශීත කළ කුකුල් මස්, හරක් මස්, එළු මස්, ඌරු මස් විකිණීම | සංජීව ස්ටෝර්ස් |
| ලියාකාන් අලිඛාන් මුස්තාන් හසන් අංක 59/4 සර් රාසික් ෆරීඩ් මාවත, තොටවත්ත, පානදුර. | අංක 71/A, එගොඩඋයන පාර, එගොඩඋයන. | ශීත කළ කුකුල් මස් විකිණීම | බිස්මි ෆාම් හවුස් |

06-803

---

**කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව**

සම්මත අතුරු ව්‍යවස්ථා වැළඳ ගැනීම

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ (අ) ඡේදය සමඟ කියවිය යුතු 261 වන අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ දකුණු පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඔහු විසින් සාදනු ලැබූ හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1834 හා 2013.10.25 දිනැති *ගැසට් පත්‍රයේ* IV(අ) කොටසේ නිවේදනය කරනු ලැබූ දකුණු පළාතේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා සහ මදුරුවන් සහ රෝගකාරක කෘමීන් විනාශ කිරීම පිළිබඳ කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා දකුණු පළාත් සභාව විසින් 2014.08.12 දින මහා සභාවේදී ස්ථිර කර 2014.10.17 දින අංක 1884/61 IV(අ) පළාත් සභා *ගැසට් පත්‍රයෙන්* ප්‍රකාශයට පත් කර ඇති අතර, 2016.05.16 දින කඹුරුපිටිය ප්‍රාදේශීය සභා තීරණ පොතේ අංක 64 යටතේ වැළඳගෙන *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දින සිට පිළිගෙන ක්‍රියාත්මක කිරීමට මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

විමලා අබේකෝන්,
ලේකම්,
කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව.

06-923

### ඉමදූව ප්‍රාදේශීය සභාව

සම්මත අතුරු ව්‍යවස්ථාව

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වන අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ දකුණු පළාතේ, පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඔහු විසින් සාදනු ලැබූ හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ අංක 1834 හා 2013.10.25 දිනැති *ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ නිවේදනය කරනු ලැබුවා වූ ද, දකුණු පළාතේ පළාත් සභාව විසින් අනුමත කර ඒ බව අංක 1884/61 හා 2014-10-17 දිනැති *ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ නිවේදනය කරනු ලැබුවා වූ ද, දකුණු පළාතේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඝන අපද්‍රව්‍ය කළමණාකරණය පිළිබඳ කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා සහ මදුරුවන් සහ රෝග කාරක කෘමීන් විනාශ කිරීම පිළිබඳ කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා, ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 02 වැනි වගන්තියේ (3) වැනි උප වගන්තියේ විධිවිධාන වලට යටත් වී පිළිගැනීමටත්, මෙම නිවේදනයට අදල විධිවිධාන ඉමදූව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කිරීමටත් 2016.04.25 දින තීරණ අංක 02 යටතේ තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

සී. එස්. මුදලිගේ,
ලේකම්,
ඉමදූව ප්‍රාදේශීය සභාව.

2016 අප්‍රේල් මස 25 වැනි දින,
ඉමදූව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

06-824

---

### නෙළුව ප්‍රාදේශීය සභාව

261 වැනි අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පත්‍රයේ 03 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර නෙළුව ප්‍රාදේශීය සභාව විසින් පහත සඳහන් උපලේඛනයේ සඳහන්, තීරණ පොතේ, තීරණ අංක 130 යටතේ වැළඳ ගෙන ක්‍රියාත්මක කරන බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එන්.එල්. ප්‍රේමසිරි,
ලේකම්,
නෙළුව ප්‍රාදේශීය සභාව.

2016 මැයි 26 වැනි දින,
නෙළුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී.

උපලේඛනය

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 02 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ (අ) ඡේදය සමඟ කියවිය යුතු 261 වැනි අධිකාරිය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 02 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර දකුණු පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2013-05-17 දින අංක 1811 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පලකරන ලද්ද වූද, දකුණු පළාත් සභාව විසින් අනුමත කරන ලද බව 2014-02-29 දින අංක 1878 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළකරන ලද නිවේදනයෙන් ප්‍රකාශයට පත්කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථාවල (i, ii, iii, xvii, xviii, xxi, xxii, xxiii, xxv හා xxviii) දක්වා වූ බාණ්ඩ මේ යෝජනා *ගැසට් පත්‍රයේ* පළකරනු ලබන දින සිට පිළිගෙන ක්‍රියාත්මක කිරීමට 2016-05-26 වැනි දින නෙළුව ප්‍රාදේශීය සභා තීරණ පොතේ තීරණ අංක 130 යටතේ තීරණය කළ බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

06-681/1

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.